# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 942/ 2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திக<br>Date | 05/06/2024<br>පැය 0530 |

# මාධ්‍ය නිවේදනය

**සමාජ මාධ්‍ය ඔස්සේ සංසරණය වූ දරුවෙකුට පහරදීමේ වීඩියෝ දර්ශණය සම්බන්ධයෙන් සැකකරු හා සැකකාරියන් දෙදෙනෙකු අත්අඩංගුවට - වැලිඔය පොලිස් ස්ථානය.**

සමාජ මාධ්‍ය ඔස්සේ සංසරණය වූ දරුවෙකුට පහරදීමේ වීඩියෝ දර්ශණය සම්බන්ධයෙන් වැලිඔය පොලිස් ස්ථානයේ නිලධාරීන් විමර්ශන ආරම්භ කර තිබු අතර, සැකකරු දරුවාද රැගෙන ප්‍රදේශයෙන් පලා ගොස් තිබුණි.

2024.06.05 වන අද දින අළුයම් කාලයේදී පුල්මුඩේ පොලිස් වසමේ අරිසිමලේ ප්‍රදේශයේදී වැලිඔය පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් මුලතිවු කොට්ඨාස අපරාධ විමර්ශන අංශයේ නිලධාරීන් සහ පුල්මුඩේ පොලිස් විශේෂ කාර්ය බලකා කඳවුරේ නිලධාරීන්ගේ සහාය ඇතිව මෙම පහරදීමේ සිද්ධියට සම්බන්ධ සැකකරු සහ ඊට ආධාර අනුබල දීම සම්බන්ධයෙන් සැකකාරියන් දෙදෙනෙකු අත්අඩංගුවට ගෙන ඇති අතර, පහරකෑමට ලක්වූ වයස අවුරුදු 04 ½ ක ගැහැණු දරුවාද පොලිස් භාරයට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 45 ක් වන අතර, සැකකාරියන් අවුරුදු 37 හා 46 වයස්වල පසුවන කල්‍යාණපුර, වැලිඔය ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

වැලිඔය පොලිස් ස්ථානය වැඩිදුර විමර්ශන සිදුකරගෙන යනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය,**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**